# ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ආර්ථික වර්ධනයට කරනු ලබන බලපෑම

ඩී. එම්. ටී. එම්. රූපසිංහ[1]

***අභිමතාර්ථය 08:*** තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සියලු දෙනාටම යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම

## 1. හැඳින්වීම

වර්තමාන ගෝලීය ආර්ථික සන්දර්භය තුළ විදේශ ප්‍රේෂණ ප්‍රවාහයන් ලෝකයේ බොහෝ අඩු දියුණු රටවල නිරන්තරයෙන් වර්ධනය වන මූල්‍ය ප්‍රවාහයක් ලෙස පෙන්වා දිය හැකිය. ඉදිරි වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා සීඝ්‍ර වර්ධනයක් රජය විසින් ඉලක්ක කර ඇති නමුත්, වසංගතය මෙන්ම එය පාලනය කිරීම සඳහා පැන වූ සීමාවන් හේතුවෙන් ලොව පුරා ආර්ථිකයන්ගේ වර්ධනය පහත වැටුණු අතර ශ්‍රී ලංකාවටද ඉන් අත්මිදීමට නොහැකි වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වාර්ෂික වාර්තාව මගින් ප්‍රකාශ කරයි.

එබැවින් මෙම තත්ත්වය හමුවේ රට තුළ තිරසාර වර්ධන වේගයක් පවත්වා ගැනීමට නම් රටෙහි සියලුම සම්පත් උපරිම ප්‍රයෝජන ගත යුතුය. සේවා නියුක්ත ජනගහනයේ කොටසක් වන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනු ලබයි. අධ්‍යයනයේ වැදගත්කම වන්නේ දැනට ලංකාවේ පවතින ඩොලර් හිඟයට විසඳුමක් ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හඳුන්වා දිය හැකි හොඳම ක්‍රමය හඳුනාගෙන, ලංකාවේ ආර්ථිකය නැංවීම සඳහා හැකි හොඳම ක්‍රමය ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හඳුන්වා දීමයි.

ඒ අනුව පර්යේෂණ ගැටළුව වන්නේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්ධනයට බලපෑම් ඇති කරනු ලබන්නේ කෙසේද? යන්නයි. ඒ යටතේ විදේශ විනිමය අස්ථාරත්වයට විසඳුම් ලෙස විදේශ සේවා නියුක්ති ප්‍රේෂණයන්ගේ මැදිහත්වීම කෙසේද? යන උප ගැටලුවද යොදා ගන්නා ලද අතර එහිදී ප්‍රධාන පර්යේෂණ අරමුණු වූයේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්ධනයට බලපෑම් ඇති කරනු ලබන ආකාරය පිළිබඳව සොයා බැලීමයි.

ලංකාවේ දැනට පවතින ඩොලර් හිඟය නිසා ආනයනකරුවන්ට මෙන්ම විදේශ අමුද්‍රව්‍ය යොදාගෙන භාණ්ඩ නිපදවන නිෂ්පාදකයන්ටද විශාල බලපෑමක් දැනටමත් සිදුවෙමින් තිබේ. රුපියල් අච්චු ගසා මෙම ප්‍රශ්නයට පිළියම් යෙදිය නොහැකි අතර මෙයට ඇති පිළියම වන්නේ විදේශ විනිමය වියදම් තවදුරටත් සීමා කිරීමත් හා විදේශ විනිමය ලැබීම් වර්ධනය කර

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
kgmadara97@gmail.com

ගැනීමත් වේ. මෙම පර්යේෂණය මගින් ඔප්පු කරන ලද්දේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මගින් මෙම ඩොලර් හිඟයට විසඳුම් ලබා දිය හැකි බවයි.

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, විශේෂයෙන්ම, පහළ සහ මැදි ආදායම් ලබන ශ්‍රී ලංකාව වැනි රටවලට පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි නිත්‍ය ප්‍රතිලාභ අත්කර දෙන බවත්, සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලබන්නන්ගේ ආදායම් ඉහළ නැංවීමට උපකාරී වෙමින් ඉහළ සාධනීය බලපෑම් ඇති කරන අතර, ප්‍රේෂණ ලැබෙන රටෙහි විදේශ විනිමය සංචිත වැඩිදියුණු කිරීමට ද දායක වනවා වගේම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, ආර්ථික අර්බුද අවස්ථාවලදී සහ ස්වාභාවික උපද්‍රවවලින් පසුවද රක්ෂණයක් ලෙස කටයුතු කරන බවයි. ද්විතියික දත්ත මත පදනම්ව පමණක් පර්යේෂණය කිරීමට සිදු වීම මෙහි ඇති එකම සීමාකාරී සාධකය විය.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය පූර්ණ වශයෙන් ද්විතියික දත්ත පදනම් කරගෙන සිදු කර ඇති අතර මේ සඳහා ප්‍රමාණාත්මක දත්ත යොදාගෙන ඇත. මෙම අධ්‍යයනය විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්ධනයට බලපෑම් ඇති කරනු ලබන්නේ කෙසේද? යන පර්යේෂණ ගැටලුව මූලික කොටගෙන සිදුකොට ඇත. මෙම පර්යේෂණ ගැටලුව විසදා ගැනීම සඳහා මූලික අරමුණක් සහ සෙසු අරමුණක් භාවිත කොට ඇත. එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය අධ්‍යයනයට භාජනය කර ඇත. එය මත පදනම්ව දත්ත රැස් කිරීම, දත්තයන් සැකසීමට ලක්කොට දත්ත විශ්ලේෂණය කිරීම මගින් නිගමනවලට එළඹීමෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වර්ධනයට බලපෑම් ඇති කරනු ලබන ආකාරය පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක් සඳහා දත්ත ලබා ගත් ආකාරය පැහැදිලි කළ හැක.

## 3. දත්ත විශ්ලේෂණය

රැස් කරගත් දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම, සහසම්බන්ධතා විශ්ලේෂණය, බහු රේඛීය ප්‍රතිපායන විශ්ලේෂණය, කයි වර්ග විශ්ලේෂණය, යන සංඛ්‍යාන ශිල්පීය විශ්ලේෂණ ක්‍රම යොදාගනු ලැබිණි.


## 4. නිගමන

### *4.1 විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයෑම් සංඛ්‍යාව සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ව්‍යාප්තිය (2011 - 2020)*

සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා සොයා ලාංකිකයන් විදේශීය රටවල් කරා සංක්‍රමණය වීම දීර්ඝ ඉතිහාසයකට හිමිකම් නොකියයි. ශ්‍රී ලාංකිකයන් විදේශ


රැකියා සඳහා පිටත්ව යාම ආරම්භ වන්නේ විසිවන ශතවර්ෂයේ මුල් කාලීනව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලන සමයේදී සිංගප්පූරුවට සහ හොංකොං යන රටවල් දෙක වෙත වුවත් වර්තමානය වන විට එය කලාප 10ක් යටතේත් වයස් කාණ්ඩ 7ක් යටතේත් සහ නිපුණතා කාණ්ඩ 5ක් යටතේත් ව්‍යාප්තව පවතී.

ප්‍රස්තාර සටහන 1: විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයෑම් (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 – 2020*


ප්‍රස්තාර සටහන 2: ප්‍රේෂණ ලැබීම් (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*


ප්‍රස්තාර සටහන 1 සහ 2 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ 2011 සිට 2020 දක්වා කාල සීමාව තුළදී විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයෑම් සංඛ්‍යාව ඇතැම් වර්ෂවලදී අඩු වී ඇති නමුත් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණ දිගින් දිගටම වැඩි වී ඇති බවයි. ඒ අනුව 2020 වර්ෂය වන විට විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයෑම් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩු වීමක් සිදුව ඇති අතර නමුත් ඊට පෙර වසර වලදී සිදු වූ පිටත්ව යෑම් නිසා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණයෙහි අඩු වීමක් දක්නට නොමැත.

ප්‍රස්තාර සටහන 3: කලාප අනුව විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්වයෑම් (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*

ප්‍රස්තාර සටහන 4: කලාප අනුව ප්‍රේෂණ ලැබීම් (2011 - 2020)





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*

ප්‍රස්තාර සටහන 3 සහ 4 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ අනුව ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යෑම් වැඩිපුරම දක්නට ලැබෙන

කලාපය තුළින් ශ්‍රී ලංකාවට වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී ඇති බවයි.

එහි දී ප්‍රස්තාර සටහන 3ට අනුව ශ්‍රී ලංකාවේ විදේශ සේවා නියුක්තිකයන්ගේ පිටත්ව යෑම් කලාප අනුව ගත් විට වැඩිම පිටත්ව යෑම් ප්‍රමාණයක් මැදපෙරදිග කලාපයට සිදුව ඇති බව කිව හැකි අතර ප්‍රස්තාර සටහන 4 අනුව ශ්‍රී ලංකාවට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබෙන කලාප ගත් විට වැඩිම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණයක් මැදපෙරදිග කලාපයෙන් රට තුළට ලැබී ඇත.


ප්‍රස්තාර සටහන 5: නිපුණතා කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ පියත්ව යෑම් (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*


ප්‍රස්තාර සටහන 5 සහ 6 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම් සංඛ්‍යාවට සමගාමීව වෘත්තීය, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු, සහ ගෘහ සේවිකා වශයෙන් නිපුණතා කාණ්ඩ 5ක් යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සිදුව ඇති අතර වර්තමානය වන විට පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන කාණ්ඩ තුන මගින් විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම් වල ඉහළ දායකත්වයක් සපයා ඇති අතර ඊට සමගාමීව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණයන්ගේද ඉහළම අගය එම කාණ්ඩ තුන මගින් ලැබී ඇත. 2011 වසර සිට 2016 වසර දක්වා ගෘහ සේවිකා කාණ්ඩය මගින් වැඩිම ප්‍රේෂණ ප්‍රමාණය ලබා දී ඇති අතර 2016න් පසුව එහි වෙනසක් සිදුව ඇති අතර වර්තමානය වන විට වැඩිම ප්‍රේෂණ ප්‍රමාණයක් පුහුණු රැකියා කාණ්ඩය මගින් ලැබී ඇත. මෙයින් පැහැදිලි වූ කරුණ වන්නේ නිපුණතා කාණ්ඩවලට අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මගින් ඩොලර් හිඟයට විසඳුමක් ලබා දීමට නම් ලංකාවේ සියලුම පාසල්වල හවස් භාගයේදී තරුණ තරුණියන්ගේ නිපුණතා මට්ටම් වැඩි දියුණු කිරීමට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බවයි. එහිදී වැඩි අවධානයක් භාෂා දැනුම ලබා දීමටත්, වෘත්තීය පුහුණු දැනුම ලබා දීමටත් කටයුතු කළ යුතු බව අත්‍යවශ්‍ය කරුණකි.

ප්‍රස්තාර සටහන 6: නිපුණතා කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණ (2011 - 2020)





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*

ප්‍රස්තාර සටහන 7: වයස් කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ පිටත්ව යෑම් (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*


ප්‍රස්තාර සටහන 8: වයස් කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණ (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*


ප්‍රස්තාර සටහන 7 සහ 8 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ වයස් කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම් සංඛ්‍යාව ගත්විට 2011 සිට 2016 දක්වා කාල සීමාව තුළදී 30 - 34 වයස් කාණ්ඩය මගින් වැඩිම විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාවක් සහ ප්‍රේෂණ ලැබීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර වර්තමානය වනවිට එහි වෙනසක් සිදුව ඇති අතර ඒ අනුව 2016න් පසුව විදේශ සේවා නියුක්තිකයන්ගේ පිටත්ව යෑම් වයස් කාණ්ඩ අනුව ගත් විට 35 - 39 වයස් කාණ්ඩය ඉහළම දායකත්වය දක්වන අතර එහි දෙවැනියට වැඩිම දායකත්වය 40 - 44 වයස් කාණ්ඩය ගනු ලබන බවත් සහ වයස් කාණ්ඩ අනුව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ගත්විටද වැඩිම ප්‍රේෂණ ප්‍රමාණය 35-39 වයස් කාණ්ඩය ගනු ලබන බවයි. ඒ අනුව පැහැදිලි වූයේ වැඩිම ප්‍රේෂණ ප්‍රමාණය 30 - 34, 35 - 39, 40 - 44 වයස් කාණ්ඩ මගින් රට තුළට ගලා එන බැවින් ඩොලර් හිඟයට විසඳුමක් ලබා දීමට නම් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාවද එම වයස් කාණ්ඩ තුළින් වැඩි කිරීම තුළින් ඩොලර් හිඟයට විසඳුමක් ලබා දිය හැකි වේ යැයි නිගමනය කළ හැක.

ප්‍රස්තාර සටහන 9: පුමිතිරිභාවය අනුව විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව (2011 - 2020)




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*

ප්‍රස්තාර සටහන 10: පුමිතිරිභාවය අනුව විදේශ සේවා නියුක්තිය සඳහා ප්‍රේෂණ ලැබීම් (2011-2020)





*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011-2020*

ප්‍රස්තාර සටහන 9 සහ 10 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ පුමිතිරිභාවය අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව ගත්විට වර්තමානය වනවිට පිරිමි විදේශ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව වැඩි අගයක් ගනු ලබන අතර විදේශ ප්‍රේෂණ ලැබීම් සංඛ්‍යාවද වැඩිම අගය පිරිමි විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය වේ.

### *4.7 ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයන් අතර විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ*

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි විදේශ විනිමය ලැබීම් සඳහා දායක වූ විශාලතම තනි මූලාශ්‍රය වී ඇති බව ප්‍රස්තාර සටහන 11 මගින් පැහැදිලි වේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ගෝලීය විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මන්දගාමී වේ යැයි පැවති අපේක්ෂාවන්ට ප්‍රතිවිරුද්ධව, 2020 වසරේ පළමු භාගයේදී වාර්තා වූ පසුබෑමෙන් පසු වේගයෙන් යථා තත්ත්වයට පැමිණීමක් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාව ඇතුළු තවත් දකුණු ආසියානු රටවල් කිහිපයක් ඉහළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් වාර්තා කළ බැවින් මින් පැහැදිලි වන්නේ ස්වභාවික විපත්, වසංගත තත්ත්වයන් පමණක් නොව ගෝලීය අර්බුද තත්ත්වයන් ආදී සෑම අවස්ථාවක් සඳහාම ශ්‍රී ලංකාවට ශක්තිමත් මෙන්ම ස්ථිරසාර මූල්‍ය ප්‍රවාහයක් ලෙස විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ක්‍රියා කරන බවයි.

ප්‍රස්තාර සටහන 11: ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයන් 2011-2020




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2011 - 2020*

ප්‍රස්තාර සටහන 11 අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ 2011 සිට 2020 දක්වා කාල සීමාව තුළ දී සංචාරක ඉපැයීම්, රෙදිපිළි හා ඇඟලුම්, තේ අපනයන හා විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලද ප්‍රේෂණ ප්‍රමාණ යන ප්‍රධාන විනිමය ඉපැයීමේ මූලයන් ගත්විට එම මූලයන් අතර විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලද ප්‍රේෂණ ප්‍රමාණ දිගින් දිගටම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විදේශ විනිමය ඉපැයීමේ මාර්ගය බවට පත්ව ඇති බව කිව හැක. ඉන් පැහැදිලි වන්නේ විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලද ප්‍රේෂණ ප්‍රමාණය ඉහළ නැංවීම වර්තමාන ඩොලර් හිඟයට හොඳම විසඳුමක් බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Amarathunga. (2007). *A Sociological study of the impact of Parental Foreign Employment on to Family Coporate based on the Puttalam District of Srilanak.* University of Kelaniya, Sri Lanka.

Ariyawathi, P. (2003). *A Study of the impact of parents' emigration for employment on their children's level of Education.* Univercity of Kelaniya, Sri Lanka.

Banerjee, A. & Chaudhury, S. (2010). Statistics without tears- Population and samples . *Industrial Psychiatry journal*, 19(1).

Bureau of Foreign Employment. (2019). Bureau of Foreign Employment, Department of Immigration and Emigration, Baththaramulla, Sri Lanka.

Bureau of Foreign Employment. (2020). Bureau of Foreign Employment, Department of Immigration and Emigration, Baththaramulla, Sri Lanka.

Central Bank Report. (2020). *Economic and Social Statistics of Sri Lanka.* Central Bank of Sri Lanka . Rajagiriya: Srilankan Central Bank printers.